# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

ශ්‍රේණිය - 10

වාරය - පළමු වාරය

නිපුණතා මට්ටම - 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි

ක්‍රියාකාරකම - නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසමු



සැකසුම -එස් .එස් . කේ . සිරිවර්ධන මිය
මප /වත් /සිරිමල්වත්ත මහා විදුහල

මෙහෙයවීම - නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස්.. මෙය ලිඛිත පාඩමකි මෙය වැඩි දුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

හැඳින්වීම..නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු 8,9 ශ්‍රේණි වලදී රූකම්,සෙල්ලිපි හා සංදේශ කාව්‍ය ඇසුරින් ඔබ විසින් අධ්‍යයනය කර ඇත.

මෙම පාඩමෙන් වංශ කථා හා විදේශිකයින්ගේ වාර්තා ඇසුරින් නර්තන කලාවේ දියුණුව සඳහා

- ❖ රාජ්‍ය අනුග්‍රහය
- ❖ ආගමික හා සමාජ පසුබිම
- ❖ භාරතීය ආභාසය

පිළිබඳ සාධක අපි අධ්‍යයනය කරමු.

# නර්තන කලාව හා බැළි ඓතිහාසික පසුබිම

- නර්තන කලාවට දිගු ඉතිහාසයක් ඇත.
- එකී නර්තනය විවිධ ස්වරූපයෙන් පැවැති ඇති බවට සාධක හමුවේ .
- මෙම කාල යුග වශයෙන් වෙන් කොට දක්වා ඇත.
- මෙම යුග වලදී විවිධ මූලාශ්‍ර ඔස්සේ නර්තනය පැවති ස්වරූපය පිළිබඳව නිගමන වලට එළඹිය හැකිය.

## නර්තන කලාව හා බැඳි ඓතිහාසික යුග

1. ප්‍රාග් බෞද්ධ යුගය
2. අනුරාධපුර යුගය
3. පොළොන්නරු යුගය
4. දඹදෙණි යුගය
5. කුරුණෑගල යුගය
6. ගම්පොළ යුගය
7. කෝට්ටේ යුගය
8. මහනුවර යුගය
9. කොළඹ යුගය

# නර්තන කලාවේ තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර

- **සාහිත්‍ය මූලාශ්‍ර වංශකථා**
  - මහාවංශය
  - දීප වංශය
  - චූල වංශය
  - ථූප වංශය
  - දඹදෙණි අස්න
  - කඳවුරුසිරිත
  - උම්මග්ග ජාතකය

- **පුරාවිද්‍යාත්මක සාධක**
  - රූකම්
  - මූර්ති
  - කැටයම්

- **සෙල්ලිපි හා අභිලේඛන**
  - සැස්සේරුව
  - කොරවක් ගල
  - පාලමෝට්ටායි

විදේශිකයන්ගේ වාර්තා

- ඉබන්බතුතා
- රොබට් නොක්ස්
- ස්පිල් බජන්

ජනප්‍රවාද හා ජනශ්‍රැත

- මහින්දාගමනය ජනප්‍රවාදයට පෙර බිහිවූයේවාය



# වංශ කථා ඇසුරින් නර්තන කලාවේ තත්ත්වය අනාවරණය කිරීම

ප්‍රාග් බෞද්ධ යුගයේ නැටුම්, ගැයුම්, වැයුම් පැවති බව ධාතුසේන රජ සමයේ රචිත මහාවංශයේ සඳහන් තොරතුරු මගින් අනාවරණය වේ.

- විජයාව තරණයටත් පෙර සිටම ලංකාවේ යක්ෂ,නාග ගෝත්‍රිකයෝ දියුණු සංස්කෘතික ලක්ෂණ වලින් යුතුබවට සාධක මහා වංශයේ දක්වා ඇත.

- විජය හා කුවේණි එක් වූ දින රාත්‍රියේ සිරීසවත්පුරයේ පැවති විවාහ මංගල උත්සවයක නැටුම්,තූර්ය වාදන හා ගීත ගායනා පැවති බව මහා වංශය සාධක දක්වයි.

# නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුනු ආකාරය වංශ කථා ඇසුරින්

## මහාවංශයේ සාධක

- විජය හා කුවේණි එක් වූ දින රාත්‍රියේ සිරීසවත්පුරයේ පැවති විවාහ මංගල උත්සවයක නැටුම්, තූර්ය වාදන හා ගීත ගායනා පැවතිබව මහා වංශය සාධක දක්වයි.

- අනුරාධපුර යුගයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ පණ්ඩුකාභය රජු ය.මේ යුගයේ නැටුම්, ගැයුම් හා පුද පූජා ආදිය පැවැත්වූ බවට තොරතුරු මහාවංශයේ ඇත.

- උත්සව අවස්ථාවල දී පණ්ඩුකාභය රජු චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් උදෙසා සම අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව සඳහන් වේ.

- (ක්‍රි.පූ. 161 - 137) දුටුගැමුණු රජු නළඟනන් පිරිවරා ගෙන කණ්ඩුල ඇතු පිට නැඟී රුවන්වැලිසෑයේ ධාතු නිදන් කිරීමේ උත්සවයට පංචතූර්ය වාදන සහිතව ගිය බව සඳහන් වේ



❖ (ක්‍රි.පූ. 9 - 21) මහා දාඨික මහානාග හෙවත් මහා දැළියාමානා රජු ගිරි භන්ඩ නම් පූජාවක් කළ බව මහාවංශයේ සඳහන් ව ඇති අතර, එම උත්සවයේ දී වීදි සරසා, සතර දොරටු සරසා, තැන තැන තොරණ, ධජ බඳවා, පහන් දැල්වා,නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වූ බව හා මෙම උත්සවයට රනින් කළ බෙර අටක් වාදනය කරන මෙන් රජතුමා නියෝග කළ බව ද පැවසේ.

❖ භාතිකාභය රජු බෝධි ස්නාන පූජාවක් (නානුමුර මංගල්‍යයක්) මහා බෝධියටපැවැත්වූ බවත්, එහි දී නැටුම් හා තූර්ය වාදන ද පැවැත්වූ බවත් මහාවංශයේ සඳහන් වේ.

❖ පොළොන්නරුවේ (ක්‍රි.ව. 1153 - 1186) රජ කළ මහා පරාක්‍රමබාහු රජු නැටුම්, ගැයුම් සඳහා විශාල ලෙස රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් රජ කෙනෙකි. මෙතුමා නැටුම්, ගැයුම්, වැයුම් සඳහා සරස්වතී මණ්ඩපය ඉදි කළ බවත් එහි දක්ෂ නළු නිළියන් යෙදවූ බවත් සඳහන් වේ.

# චූලවංශයේ සාධක

❖ රන් ආලේප කරන ලද කුලුනුවලින් හා චීන පටසළුවලින් අලංකාර කරන ලද සරස්වතී මණ්ඩපය නැටුම්, ගැයුම් සඳහා ඉදි කර ඇත. එහි රජුගේ හමුදාවේ සෙබළුන්ගේ ආස්වාදය උදෙසා නැටුම්, ගැයුම් කරවූ බව ද සඳහන් වේ.



- පරාක්‍රමබාහු රජු නගර නිර්මාණයේ දී නාට්‍ය ශාලා ඉදි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව නාට්‍ය ශාලා පහක් ඉදි කරන ලද බව චූලවංශයේ සඳහන් වේ.

- පරාක්‍රමබාහු රජු විසින් දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා විශේෂ මණ්ඩපයක් සකස් කර, මණ්ඩපය වටා අලංකාර ආභරණ ගත ලා ගත් නළඟනෝ බොහෝ දෙනෙක් තබන ලදහ. එමෙන් ම බටනළා, වීණා සහ නොයෙකුත් බෙර වර්ග වාදකයන් යොදවා සිටි බව ද කියැවේ.



# වංශ කථා ඇසුරින් එළඹිය හැකි නිගමන

වංශකථා සාධක දක්වන්න ඉතිහාස ගත තොරතුරු අනුව බොහෝ රාජ්‍ය පාලකයෝ නැටුම්,ගැයුම්, වැයුම් සඳහා අනුග්‍රහය දක්වා ඇති බවත්, රාජකීය උත්සව සඳහා නැටුම්,ගැයුම්, වැයුම් යොදා ගෙන ඇති බව පැහැදිලි වේ.

රාජ්‍ය පාලකයන් බෞද්ධාගමික උත්සව සඳහා නැටුම්, ගැයුම්, වැයුම් යොදා ගෙන ඇති බවත් බෞද්ධාගම නිසා නැටුම්, ගැයුම්, වැයුම් පෝෂණය වී ඇති බවත් හඳුනාගත හැකිය.

මෙම සියලු කරුණු අනුව අපට එළඹිය හැකි නිගමනය වන්නේ අනුරාධපුර යුගයේ හා පොළොන්නරු යුගයේ රජකල රජවරුන් නර්තන කලාවට මහත් ඇල්මක් දැක්වූවා සේම රාජ්‍ය පාලනය හා බැඳි සියලු ආගමික හා සමාජ උත්සවයකදීම නර්තන, වාදන යොදාගෙන ඇති බවත් රජ මාලිගය තුල නර්තනයට විශේෂ තැනක් හිමිව තිබූ බවත්,රජුගේ විනෝදයට නර්තනය පැවැත්වූ බවත් එම කාර්යයන්ට රජු අනුග්‍රහය දක්වා ඇති බවත් තහවුරු වේ.

# විදේශිකයන්ගේ ඓතිහාසික වාර්තා

- නර්තන කලාව හා සබැඳි තොරතුරු විමසීමේදී විදේශිකයින්ගේ වාර්තා තවත් වැදගත් එක් මූලාශ්‍රයකි

- ශ්‍රී ලංකාවට විවිධ යුගයන්හි දී විදේශිකයින් පැමිණ ඇත.

- ඉබන් බතූතා,රොබට් නොක්ස්, ස්පිල් බර්ජන්,ෆාහියන් යනාදී මෙරටට පැමිණි විදේශිකයන්වේ.

- එම විදේශිකයන්, සංචාරකයින් ලෙසද,රජයේ සිරකරුවන් ලෙසද වාසය කර ඇත.

- තම කෘති හා වාර්තා මගින් ඔවුන් පැරණි යුගයන් හි නර්තන කලාව පැවති ආකාරය පිළිබඳව තොරතුරු අනාවරනය කර ඇත.

- ආගමික හා සමාජ උත්සව සඳහා නර්තනය යොදාගත් ආකාරය සහ එකල පැවති නර්තන විලාසයන් පිළිබඳව අවබෝධයක් එම සාධක තුළින් හෙළිකර ගත හැකිවේ.

# ඉබන් බතූතා



- 14 වන සියවසේ දී,ගම්පොළ යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි අරාබි ජාතික සංචාරයකි.

- විදේශීකයන් දුටු පුරාණ ලංකාව නැමති කෘතියේ එකල තිබූ නර්තනය පිළිබඳව ඔහු විසින් වාර්තාවක් ඉදිරිපත්කර ඇත.

- දෙවුන්දර උපුල්වන් දේවාලයයේ මිනිස් ප්‍රමාණ උස දෙව්රුවක් අබියස පන්සියයක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව යි. (විදේශීකයන් දුටු පුරාණ ලංකාව)

# ස්පිල් බර්ජන්



ජොරිස් වෑන් ස්පිල්බර්ජන්

- මහනුවර යුගයේ (ක්‍රි.ව. 1592 - 1604) විමලධර්මසූරිය රජ සමයේ ලංකාවට පැමිණි ලන්දේසි ජාතිකයෙකි

- ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් මහනුවර පෙරහැරේ නැටුම් පිළිබඳ මෙසේ ලියා ඇත.

''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සණට නටත් . ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර, යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේ ය.''

# රොබට් නොක්ස්



❖ මහනුවර යුගයේ (දෙවන) රාජසිංහ රජ සමයේ (ක්‍රි.ව. 1636- 1686) ලංකාවට පැමිණ වසර 18ක් පමණ ලංකාවේ සිරකරුවකු ලෙස සිටි ඉංග්‍රීසි ජාතිකයෙකි.

❖ ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් එදා හෙළදිව නම් තම ග්‍රන්ථයේ ඇසළ පෙරහැර පිළිබඳ වත්, එහි තේවාව පිළිබඳ වත් මෙසේ සඳහන් කර ඇත.

> 'එහි දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙත්. ඔවුන් හට නියම වූ විවිධ ක්‍රීඩා කරමින් තුන් දෙනා බැගින් අතිනත ගෙන රඟන ස්ත්‍රීහු වෙති.''

# විදේශිකයින්ගේ ඓතිහාසික වාර්තා තුළින් එළඹිය හැකි නිගමන

❖ ආගමික හා සමාජ උත්සව සඳහා නර්තනය යොදාගෙන තිබීම.

❖ දේවාල විහාර වල සිදුවන්නාවූ කටයුතු සඳහා නියමිත කුල වලින් පැමිණි කාන්තාවන්ද නර්තනයේ නිරත වූ බව පැහැදිලි වේ.

❖ දෙවියන්ට පුද පූජා පිනිස හින්දු බාලිකාවන් නැටූ බව හා එකල නර්තන කලාවට භාරතීය ආභාසය ලැබී ඇති බවද පෙනියයි.

❖ භරත නැටුම් වල එන දේව දාසි සංකල්පය එකල පැවති බවත් හදුනාගත හැකිය.